## මොරටුව දිසා අධිකරණයේදී ය

සුගතපාල සමරරත්න කොඩිකාර
අංක: 96 මාතර පාර
දෙවිනුවර

පැමිණිලිකරු

- එදිරිව -

නඩු අංකය: 183/DPA (බෙදුම)
ස්වභාවය: බෙදුම
වටිනාකම: රු: 3,500,000/-
කාර්යය පටිපාටිය : සාමාන්‍ය

1 චන්ද්‍රසෝම පියතිලක සමරරත්න කොඩිකාර
අංක: 9/4 ගඟබොඩ පාර
සුවාරපොළ පිළියන්දල

2 නන්දසෝම තිලකසිරි සමරරත්න කොඩිකාර
අංක: 20
ලක්ෂපතිය මොරටුව

3 ආනන්ද ප්‍රේමතිලක සමරරත්න කොඩිකාර
අංක: 39 දෙවන පටුමග
ලේඩි කැතරින් ආදර්ශ නගරය
තෙලවල පාර (ශ්‍රී රාහුල පාර)
රත්මලාන

4 නන්දිකා දර්ශනී සමරරත්න කොඩිකාර උදේනි
අංක: 39 දෙවන පටුමග
ලේඩි කැතරින් ආදර්ශ නගරය
තෙලවල පාර (ශ්‍රී රාහුල පාර)
රත්මලාන

විත්තිකරුවන්

වර්ෂ 2023 ක්වූ ඔක්තොම්බර් 27 වන දිනදිය

ඉහත නම් සඳහන් 1 වන විත්තිකරු සිය නීතිඥ "ශිරන්ති ගුණවර්ධන ඇසෝසියේට්ස්" යන නාමය විලාසය හා ව්‍යාපාරය යටතේ නීතිඥ වෘත්තියේ යෙදෙන ශිරන්ති ගුණවර්ධන, රංජිත් ගුණවර්ධන සහ ඔවුන්ගේ සහයක සහයිකාවන් වන තනුෂ්කා ගුණවර්ධන යන නීතිඥයන් මගින් පෙනී සිටිමින් ඉදිරිපත් කරනු ලබන හිමිකම් ප්‍රකාශයේ වගනම:-

1 මෙහි මින්මතු විශේෂයෙන් පිලිගන්නා කරුණක් හැරෙන්නට පැමිණිල්ලේ සඳහන් අන් සියළුම සම්ප්‍රකාශයන් ප්‍රතික්ෂේප කරයි

2 පැමිණිල්ලේ 1 වන ඡේදයේ සඳහන් ප්‍රකාර මුල් අයිතිකරු මල්කාන්ති ප්‍රනාන්දු යන අය බව පිලිගනී

3 පැමිණිල්ලේ 2 වන ඡේදයේ විස්තර කර ඇති අංක: 517 දරණ ඔප්පුවේ පැමිණිලිකරුගේ නම සහ 1 සිට 4 දක්වා විත්තිකරුවන්ගේ මෑණියන් වන සෝමාවති සමරරත්න කොඩිකාර යන අයගේ නම සඳහන්ව ඇති බව පමණක් පිලිගෙන පැමිණිලිකරුගේ අයිතිය ප්‍රතික්ෂේප කරමින් එම ඡේදයට මෙසේද පිලිතුරු සපයයි

(I) මෙම නඩුවේ පැමිණිලිකරු සෝමාවති සමරරත්න කොඩිකාර යන අයගේ සහෝදරයෙකි

(II) වර්ෂ 1963 සැප්තැම්බර් මස කාලසීමාවේදී ඔහු මරදානේ පන්සලක උසස් පෙල හැදෑරීම සඳහා යොමු කොට තිබූ බවත්

(III) පැමිණිලිකරු ඒ වන විට වයස අවුරුදු 20 ට අඩු පුද්ගලයෙකු වූ බවත්

(IV) එම කාලසීමාවේදී පැමිණිලිකරු අධ්‍යාපන කටයුතු සඳහා සොහොයුරියක වූ සෝමාවති සමරරත්න කොඩිකාර සහ ඇයගේ ස්වාමිපුරුෂයා වූ රුබන් කංකානමගේ කොඩිකාර සහ මෙම නඩුවේ 1 සිට 4 දක්වා විත්තිකරුවන් ද යටතේ අංක: 50/7 ද මැල් පාර ලක්ෂපතිය දරණ ස්ථානයේ සිට අධ්‍යාපනය හැදෑරූ බවත්

(V) වර්ෂ 1963 දි පමණ ලේඩි කැතරින් මොඩ්ල් ටවුන් යන ව්‍යාපෘතිය යටතේ ලේඩි කැතරින් ගෘෘප් කියන ඉඩම කැබලි කර විකිණීමට පියවර ගෙන තිබූ බවත්

(VI) තෙලවල පාරට මුහුන ලා පිහිට කැබලි අංක: 39 දරණ ඉඩමට 1 සිට 4 දක්වා විත්තිකරුවන්ගේ පියා වූ රූබන් කංකානමගේ කොඩිකාර යන අය රුපියල් දොළොස් දහස් හාරසිය විසි පහක (රු: 12,425/-) මුදලකට මිලදී ගැනීමට එකග වූ බවත් එකී එකගතාවය අනුව වර්ෂ 1963/09/06 හෝ ඊට ප්‍රථම සම්පූර්ණ මුදල ගෙවා අවසන් කිරීමට එකී රූබන් කොඩිකාර එකග වී ප්‍රථම අත්තිකාරම වශයනේ කුවිතාන්සි අංක: 109 යටතේ රු:300/-ක මුදලක් ද ඉන්පසු කුවිතාන්සි අංක: 118 යටතේ රු: 200/-ක මුදලක් ද ඉන්පසු කුවිතාන්සි අංක: 125 යටතේ රු: 500/-ක මුදලක් ද වශයනේ අත්තිකාරම් මුදල් ගෙවන ලදි

(VII) ඉන් අනතුරුව 1සිට 4 විත්තිකරුවන්ගේ පියා වූ ද සෝමාවති සමරරත්න යන අයගේ ස්වාමිපුරුෂයා වූ ද රූබන් කංකානම්ගේ කොඩිකාර එවකට රජයේ නිලධාරියකු වශයෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කළ බවත්

(VIII) එම අවස්ථාවේදී රූබන් කංකානම්ගේ කොඩිකාර යන අයගේ නමින් අංක: 50/7 ද මැල් පාර ලක්ෂපතිය දරණ ස්ථානයේ පිහිට දේපළේ හිමිකාරීත්වය තිබූ බවත්

(IX) එසේ රජයේ නිලධාරියකු වශයෙන් තවත් දේපළ තබා ගැනීම නුසුදුසු බවට ඩී එස් කොඩිකාර නැමති මවගේ පියාගේ මතය වූ බවත් එසේ හෙයින් මවගේ නම සහ එවකට පාසල් අධ්‍යාපනය ලබමින් සිටි පැමිණිලිකරුගේ ද නම ඇතුලත් කොට දෙදෙනාගේ නමින් ලිවිය යුතු බවට නිරණයකට පැමිණි බවත් එසේ හෙයින් මෙම බෙදීමට යෝජිත දේපළ කිසිසේත් පැමිණිලිකරු ගෙවූ ප්‍රතිග්ධාවක් මත ඔහුගේ අර්ථලාභය පිණිස මිලදී නොගත් දේපළක් බවත්

(X) අංක: 517 දරණ ඔප්පුව් නොතාරිස් සහතිකයේ අංක: 1සිට 4 දක්වා විත්තිකරුවන්ගේ පියා විසින් ගෙවන ලද රු:1,000/-ක මුදල ඔප්පුව ලිවීමට පෙර ගෙවා ඇති බව තහවුරු කර ඇති බවත් තවත් රු: 9,000/-ක මුදලක් මවගේ පියා විසින් චෙක්පතකින් ගෙවා ඇති බවත් තවත් රු: 1,290/-ක මුදලක් දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවක සුබ සාදක සංගමයේ රූබන් කංකානමගේ කොඩිකාර නමින් 1963/09/05 වන දින නිකුත් කළ චෙක්පතකින් ගෙවූ බවත් ඉතිරි රු: 1,135/- මුදලින් රූබන් කංකානමගේ කොඩිකාර විසින් ගෙවන ලද බවටත් මුද්දර ගාස්තු වූ රු:201/-ක්ද නීතිඥ ගාස්තු ද එකී රූබන් කොඩිකාර විසින් ගෙවූ බවත්

(XI) ඒ අනුව 1 සිට 4 දක්වා විත්තිකරුවන්ගේ පියා ඉහත කී අයුරින් මිලදී ගත් දේපලේ සම්පූර්ණ ප්‍රතිග්ධාව ගෙවා ඇති බවත්ය

4 වර්ෂ 1964 දි පමණ පැමිණිල්ලේ උපලේඛණයේ සඳහන් දේපලේ 1 සිට 4 දක්වා විත්තිකරුවන්ගේ පියා විසින් පදිංචිය පිණිස දෙමහල් ගොඩනැගිල්ලක් සෑදීම සඳහා ගොඩනැගිලි සැලැස්මක් එවකට මාමපේ කැස්බෑව ගමකාර්ය සභාවට වර්ෂ 1964/09/09 දින අංක: 163/1964 දරණ ගොඩනැගිලි සැලැස්ම ඉදිරිපත් කල බවත් වර්ෂ 1965/01/18 දින එය අනුමත කර ඇති බවත් කියා සිටී

5 තවද එම අවධියේදීම 1 සිට 4 විත්තිකරුවන්ගේ පියා විසින් මෙම පැමිණිල්ලේ උපලේඛණයේ විස්තර කරන දේපළේ දකුණු පසින් පිහිටි ශ්‍රී රාහුල මාවත ඔස්සේ ඇති මායිම් තාප්පය ද බස්නාහිර දිගින් පිහිට මායිම් තාප්පය ද 2 වන පටුමග මුහුණ ලා ඇති ගේට්ටුව ද තනා නිම කොට බුක්ති විඳිම ආරම්භ කල බවට කියා සිටී

6 1 සිට 4 විත්තිකරුවන් පාසල් ගියේ ද, විවාහ වූයේ ද, දැනට පදිංචිව සිටන්නේ ද පැමිණිල්ලේ සඳහන් දේපළේ පිහිටි නිවාසයේ පදිංචිය දරමින් බව කියා සිටී

7 වර්ෂ 1965 සිට 2012 වර්ෂයේ දි 1 සිට 4 විත්තිකරුවන්ගේ පියා මියයන තෙක් මෙකී උත්තරයේ දෙවන උපලේකණයේ විස්තර කරන දේපළේ නඩත්තුව වැඩිදියුනු කිරිම ද ජලය විදුලිය සහ වරිපනම් බදු ගාස්තු ද ඔහුගේ නමින් ගෙවා නිමකර ඇති බව කියා සිටී

8 මෙම දේපළේ පිහිට පොල්ගස් සියල්ල ද, පැලපොල් ගස් සියල්ල ද, අඹගස් සියල්ල ද පුවක් ගස් මහෝගනී ගස් කුරුඳු ගස් බිලං ගස් සියල්ලද 1 සිට 4 දක්වා විත්තිකරුවන්ගේ පියා විසින් සිටුවා ඉන් ලැබෙන පලතුරු ආදායම් සියල්ල තනිව බුක්ති විඳි බවත් කියා සිටී

9 වර්ෂ 2012 දි 1 සිට 4 දක්වා විත්තිකරුවන්ගේ පියාගේ මරණින් පසු මවගේ උරුමයට හා පියාගේ උරුමයට පැමිණිල්ලේ උපලේඛනයේ සඳහන් දේපළ සාරෝපණය වී ඔවුන් මේ දක්වා බුක්ති විඳින බව කියා සිටී

10 වර්ෂ 2016 හෝ ඊට ආසන්න කාලසීමාවේදී 1 සිට 4 දක්වා විත්තිකරුවන්ගේ මැණියන් සමඟ පැමිණිලිකරු හබයක් ඇති කර ගත් බවත් වර්ෂ 2016 දී පැමිනිලිකරු 1 වන විත්තිකරුට එරෙහිව කැස්බෑව ප්‍රදේශයේ පිහිටි ඉඩමක් සම්බන්ධයෙන් ද ඇති වූ හබයක් කරණ කොට ගෙන කැස්බෑව දිසා අධිකරණයේ අංක: 239/ඉඩම් දරණ නඩුව පවරන ලදි

11 ඉහත කී ඡේදයේ සඳහන් හබය වර්ෂ 2015 දී හෝ ඊට ආසන්න කාල සීමාවේදී පටන් ගත් බවත් ඉන් අනතුරුව පැමිණිලිකරු මෙම නඩුව පවරන ලදි

12 ඒ අනුව පැමිණිල්ලේ 4 වන ඡේදයේ සෝමාවති සමරරත්න කොඩිකාර නොබෙදූ දෙකෙන් පංගුවකට (1/2) අයිතිකාරිය බවට කර ඇති ප්‍රකාශ පමණක් පිලිගෙන සෙසු සම්ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි

13 පැමිණිල්ලේ 5, 6 සහ 7 ඡේදයන් පිලිගනි

14 පැමිණිල්ලේ 8 වන ඡේදය තරයේ ප්‍රතික්ෂේප කරයි

15 පැමිනිල්ලේ 9 වන ඡේදයේ සහ 10 වන ඡේදයේ හිමිකම් බෙදී යාමේ සම්බන්ධයෙන් ඇති සම්ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි

16 පැමිණිල්ලේ 11 වන ඡේදය ප්‍රතික්ෂේප කරයි

17 පැමිණිල්ලේ 12 වන ඡේදය ප්‍රතික්ෂේප කරයි

18 එසේ හෙයින් 1 වන විත්තිකරු කියා සිටින්නේ පැමිණිලිකරුට මෙම බෙදීමට යෝජිත දේපළේ මේ දක්වා කිසිදු බුක්තියක් හෝ පදිංචියක් නොමැති බවත්, මෙම දේපලේ ගොඩනැගිලි ඉදි කිරීම වැඩිදියුණු කිරීම් ව්‍යවස්ථාපිත ගෙවීම් සියල්ලක් සම්බන්ධයෙන් හබ කර නැති බවත්, පැමිණිලිකරු 1 සිට 4 දක්වා විත්තිකරුවන්ගේ දෙමව්පියන් මෙම දේපලේ නිරවශේෂ අයිතිකරුවන් වශයෙන් පිලිගෙන ක්‍රියා කර ඇති බවත්, එසේ හෙයින් 1 වන විත්තිකරු සහ සෙසු විත්තිකරුවන්ට මෙම දේපළ වසර 50කට අධික කාලයක් නිදහස්ව නිරවුල්ව හා ස්වෛරීව තමන්ගේ දේපළක් වශයෙන් බුක්ති විඳිම මගින් කාලාවරෝධී අයිතිවාසිකම් හිමිව ඇති බව කියා සිටී

19 1 වන විත්තිකරු ඒ අනුව කියා සිටින්නේ වර්ෂ 1963/09/18 වන දිනට සී පී ජයසූරිය නොතාරිස් සහතික කල අංක: 517 දරණ ඔප්පුව මත සෝමවති සමරරත්න කොඩිකාර යන මැණියන්ගේ නොබෙදූ දෙකෙන් පංගුව සඳහා මව් උරුමයට 1 සිට 4 දක්වා විත්තිකරුවන්ට මෙහි පහත උපෙල්ඛනයේ දෙවනුව විස්තර කරන ඉඩම සඳහා එක් එක් අයකුට 1/4 පංගුවක් බැගින් හිමි වන බවද

20 වැඩිදුරටත් 1 වන විත්තිකරු කියා සිටින්නේ සෝමවති සමරරත්න කොඩිකාර අන් සියල්ලන්ගේ අයිතිවාසිකම් වලට එරෙහිව දීර්ඝකාලයක් නිරවුල්ව හා ස්වාධිනව බුක්ති විඳිම කරණ කොට ගෙන මෙහි පහත 2 වන උපලේඛණයේ විස්තර කරන දේපලේ ඉතිරි නොබෙදූ දෙකෙන් පංගුවේ (හො 1/2) අයිතිය හිමිකර ගෙන ඇති බැවින් මව් උරුමයට එම කොටස සඳහා 1 සිට 4 දක්වා විත්තිකරුවන්ට එක් එක් අයකුට මව් උරුමයට 1/4 පංගුවක් අයත්ව ඇති බවට කියා සිටී

21 එසේ හෙයින් 1 වන විත්තිකරු කියා සිටින්නේ මෙම නඩුවේ පැමිණිල්ල නිෂ්ප්‍රභා කරන මෙන් ද මෙම බෙදුමට යෝජිත උත්තරයේ 2 වන උපලේකණයේ විස්තර කරන දේපළ 1 සිට 4 දක්වා විත්තිකරුවන් අතරේ එක්එක් අයකුට හතරෙන් පංගුව බැගින් බෙදා වෙන් කර ගැනිමට බෙදුම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව නඩු තින්දුවක් ලබා ගැනිමට ද ඒ ඒ කොටස් වල බුක්තිය 1 සිට 4 දක්වා විත්තිකරුවන්ට ලබා ගැනිම සඳහා තින්දු ප්‍රකාශයක් ද එම දේපළ තුළ පිහිටි නිවාසය සහ ගෙහකොළ 1 සිට 4 දක්වා විත්තිකරුවන්ට පොදුවේ හිමි බවට තින්දු කරන මෙන් ද මෙම නඩුවේ ගාස්තු ලබා දෙන ලෙසත් වේ

22 වැඩිදුරටත් පිලිතුරු දෙමින් 1 වන විත්තිකරු කියා සිටින්නේ පැමිණිල්ලේ උපලේකණයේ සඳහන් ඉඩම බෙදීමට ඉල්ලා සිටීම දෝෂ සහගත බවත් ඊට හේතුව පැමිණිලිකරුට මෙම දේපලේ පසෙහි කිසිදු අයිතියක් නොමැති බවත් ඒ අනුව මෙම නඩුව නිතියෙන් අවකල්පිත නඩුවක් බවත් එම නිසා මෙම පැමිණිල්ල නිෂ්ප්‍රභා කළ යුතු බවත් ය

23 1 වන විත්තිකරු මෙම නඩුවේ වටිනාකම රුපියල් මිලියන 15 ක් බවට තක්සේරු කර සිටී

<u>එසේ හෙයින් 1 වන වත්තිකරු ගරු අධිකරණයෙන් අයැද සිටින්නේ</u>

(අ) මෙම නඩුවේ පැමිණිල්ල නිෂ්ප්‍රභා කරන මෙන් ද

(ආ) උත්තරයේ 2 වන උපලේඛණයේ විස්තර කරන දේපළ 1 සිට 4 දක්වා වත්තිකරුවන් අතරේ එක් එක් අයකුට නොබෙදූ හතරෙන් පංගුව බැගින් බෙදා වෙන් කර ගැනීමට බෙදුම් පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව නඩු තීන්දුවක් ලබා දෙන මෙන් ද

(ඇ) මෙම නඩුවේ ගාස්තු සහ ගරු අධිකරණයට යෙහෙකැයි හැගෙන වෙනත් සහ වැඩිමනත් සහනයන් ලබා දෙන ලෙසත් වේ

1 වන වත්තිකරුගේ නීතිඥ

<u>ඉහත කී 1 වන උපලේඛණය.</u>

බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිට කෝරලේ පල්ලේ පත්තුවේ මොරටුව මහ නගර සභා සීමාව තුළ, මොරටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල සීමාවේ, තෙලවල යන ගම ග්‍රාම නිලධාරි කොට්ඨාශ අංක: තෙලවල පිහිටි ලේඩි කැතරින් ගෘෘජ කියන ඉඩමෙන් වෂී 1962/12/31 දිනට එච් ඩබ්ලිව් ප්‍රනාන්දු බලයලත් මිනින්දෝරුතැන විසින් මැන සකස් කල අංක 2890 පිඹුරේ <u>ලොට් 39</u> දරණ <u>උතුරට:</u> අංක: 2890 පිඹුරේ ලොට් 136 (කාණුව ) ද, <u>නැගෙනහිරට</u>: අංක: 2890 පිඹුරේ ලොට් 136 (කාණුව ) ද <u>දකුණට</u>: තෙලවල පාර ද, <u>බස්නාහිරට:</u> අංක: 2890 පිඹුරේ ලොට් 13 14 සහ 15 ද මායිම් වූ පර්චස් තිස් පහයි දශම පහක් (අක්: 0 රූඩ්: 0 පර්: 35.5) ක් විශාලැති ඉඩමේ පිහිටි සෑම සියලු දේද සමග වේ <u>මෙම ඉඩම නුගේගොඩ-දෙල්කඳ ඉඩම කාර්යාලයේ M 758/188 දරණ පත් ඉරුවේ ලියා පදිංචි වී</u> ඇත

<u>ඉහත කී 2 වන උපලේඛණය.</u>

මෙම ඉඩමට එල් පි ලියනගේ මිනින්දෝරු තැන මැන සෑදූ මුලික පිඹුරට අනුව පහත සඳහන් ලෙස විස්තර වේ

බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිට කෝරලේ පල්ලේ පත්තුවේ මොරටුව මහ නගර සභා සීමාව තුළ, මොරටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාල සීමාවේ, තෙලවල යන ගම ග්‍රාම නිලධාරි කොට්ඨාශ අංක: තෙලවල පිහිටි ලේඩි කැතරින් ගෘෘජ කියන ඉඩමට මොරටුව දිසා අධිකරණයේ අංක: 183/බෙදුම් නඩුවේ නිකුත් කළ අධිකාරිපත්‍රය ප්‍රකාරව වෂී 2017/05/18 වන දින එල් පි ලියනගේ උසාවි කොමසාරිස් හා මිනින්දෝරු තැන විසින් මැන සකස් කල අංක 1848 පිඹුරේ <u>කැබලි අංක: 1</u> ලෙස නිරූපිත <u>උතුරට:</u> සිමෙන්ති කාණුව ද, <u>නැගෙනහිරට</u>: සිමෙන්ති කාණුව ද <u>දකුණට</u>: ශ්‍රී රාහුල මාවත ද, <u>බස්නාහිරට:</u> ලේඩි කැතරින් වත්ත ජේ සී දොන් පෝල් ආර් එස් සෝමරත්න සහ එච වපස්සි හිමි යන මායිම් තුළ **පර්චස් තිස් හතයි දශම හයයි අටක්** (අක්: 0 රූඩ්: 0 පර්: 37.68) (හෙක්: 0.0953) ක් විශාලැති ඉඩමේ පිහිටි සෑම සියලු දේද සමග වේ

1 වන වත්තිකරුගේ නීතිඥ